# 2. අල් - ඉබාදාත්

## 2:1 සලාතය ඉටු කරමු

* සලාතය වැදගත් වගකීම් වලින් එකකි.
* සලාතය අල්ලාහ් වෙනුවෙන් ම ඉටුකළ යුතු ය.
* සලාතයේ වැදගත්කම
* සලාතය අත්හැරීම මහා වරදකි.
* ජමාඅත් වශයෙන් සලාතය ඉටුකිරීම අධික ආනිසංස ලබා දෙයි.

ඉස්ලාමීය ෂරීආවේ සලාතය ඉතා වැදගත් වගකීම් වලින් එකකි. සලාතයේ වැදගත්කම හා එහි නීති රීති නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා උගන්වා දී ඇති ආකාරයට ඉගෙන ගෙන අවබෝධය ලබා එය ඉටුකිරීම සෑම වැඩිවියට පත් මුස්ලිම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම වගකීමකි.

ජිහාද් පෙරමුණේදී පවා සලාතය සුරැකිය යුතු බව අල්කුර්ආන් පහත සඳහන් පරිදි පවසයි. "(නබි වරයාණෙනි, යුධ පෙරමුණේ දී) ඔබ ද ඔවුන් සමඟ හිඳ ඔවුන්ට සලාතය ඉටුකරවීම සඳහා (ඉමාම් ලෙස) සිටින්නේ නම්, ඔවුන්ගෙන් පිරිසක් (සලාතය ඉටුකිරීම පිණිස) සිටිත්දෙන් තව ද, තමන්ගේ ආයුධ අරගනිත්දෙන්. ඔබ සමඟ මොවුන් සජ්ද කර හමාරනම් ඔවුන් (පෙළෙන් ඉවත් වී) ඔබට පිටුපසින් (ඔබ රැක) සිටිත්දෙන්. (එවිට) සලාතය ඉටු නොකර සිටි තවත් පිරිසක් පැමිණ ඔබ සමග (එකතු වී) සලාතය ඉටු කරත්දෙන්. (මක් නිසාද යත්) ඔබ ඔබගේ බඩුබාහිරාදියෙන් හා ආයුධවලින් නොසැලකිලිමත් වූයේ නම් ඔබ මත කඩාපැන පහරදීමට එම අවිශ්වාසවන්තයෝ බලාපොරත්තු වෙති" (4:102)

සලාතය මුස්ලිම්වරුන් මත අනිවාර්ය කරන ලද්දක් බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ද පැවසූහ. සලාතය අත්හල තැනැත්තා මුස්ලිම්වරයෙකු නොවන බව අවවාද කළහ.

**ඉස්ලාම්හි වගකීම් පහකි**

* අල්ලාහ් හැර නැමදුම් කිරීමට වෙනත් දෙවියෙකු නොමැති බව ද මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් අල්ලාහ්ගේ දූතයා බව ද සාක්ෂි පැවසීම.
* (පංචකාල) සලාතය ඉටු කිරීම.
* (රමළාන් මස) සව්ම් සමාදන් වීම.
* සකාත් ගෙවීම.
* හජ් ඉටු කිරීම.

පරලොවේ දී ප්‍රථමයෙන් ම විමසනු ලබන්නේ මේ පිළිබඳවයි”

යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරී, මුස්ලිම්) “ගැත්තෙකුගෙන් මුලින් ම විමසනු ලබන්නේ සලාතය ගැනයි. එය නිවැරදි ව ඉටුකර ඇත්නම් සියලු වත් පිළිවෙත් නිවැරදිව පවතී. එය වැරදි නම් අනෙකුත් සියලු වත් පිළිවෙත් වැරදිව පවතී” (තබරානී)

**සලාතය අල්ලාහ් වෙනුවෙන් ම ඉටුකළ යුතු ය.**

අල්ලාහ් වෙත අපේ අමල් පිළිගැනීමට කොන්දේසි දෙකක් අවශ්‍ය වේ.

1. **ඉඛ්ලාස් (පිවිතුරු චේතනාව)**
2. **ඉත්තිබාඋන් (නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ සුන්නාව අනුගමනය කිරීම).**

අල්ලාහ් අල්කුර්ආනයේ පහත සඳහන් පරිදි පවසයි.

" فَمَنْ كَانَ يَرْجُوْ لِقَاءَ رَبِّهِ فَلْيَعْمَلْ عَمَلاً صَالِحًا وَلَا يُشْرِكْ بِعِبَادَةِ رَبِّهِ أَحَدًا "

“යමෙකු තම අධිපතියා හමුවීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු සත්ක්‍රියාවල යෙදේවා! තම අධිපතියා ගේ නැමදුමෙහි ඔහු කිසිවෙකු හවුල් නොකරත්වා! (18:110) මෙම ආයතයේ සඳහන් සත්ක්‍රියාව යන්නෙහි අදහස ඉඛ්ලාස් යන්නයි. ඉමාම් ඉබ්නු කසීර් රහ්මතුල්ලාහි තුමා පවසා ඇත්තේ මෙම අදහසය. “ඉඛ්ලාසයෙන් (චිත්ත පාරිශුද්ධියෙන්) තොර ව ඉටුකරනු ලබන සලාතය එය ඉටුකරන්නාගේ මුහුණෙහි පෙරළා විසි කරනු ලබන අතර එවැනි කිසිම ඉබාදතයක් අල්ලාහ් විසින් පිළිගනු නොලැබේ.”

සලාතය ඉටු කිරීම ස්වර්ගයට පිවිසීමට ඉතා වැදගත් කරුණක් බව අල්කුර්ආනය පහත සඳහන් පරිදි පවසයි.

"තව ද ඔවුහු තම සලාතයන් සුරක්ෂිත කරති; මොවුන් ම ය. (ස්වර්ගයට) උරුමක්කරුවෝ (වෙති); මොවුහු ෆිර්දව්ස් (නම් ස්වරගයේ) උරුමක්කරුවෝ වෙති; ඔවුහු එහි සදහටම වැජඹෙති." (23 : 911)

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමානන් සලාතය ඉටු කළ ආකාරය අනුව සන්සුන්ව හා අල්ලාහ් පිළිබඳ සිතුවිල්ලෙන් අප ද සලාතය ඉටු කළ යුතු ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ඉගැන් වූ සලාතයට පටහැනිව සලාතයෙහි යෙදෙන්නන් ගේ සලාත් අල්ලාහ් විසින් පිළිගනු නොලැබේ.

දිනක් නබි හිතවතෙකු මස්ජිදයේ සලාතය ඉටු කර පැමිණෙන විට (නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඔහුට) “ඔබ සලාතය ඉටු නොකෙළේ ය. (ඔබගේ සලාතය පිළි නො ගැනේ) නැවත ගොස් සලාතය ඉටු කරන්න යැයි පැවසූහ.

ඔහු දෙවෙනි වරට සලාතය ඉටුකර පැමිණියේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එසේ ම පැවසූහ. ඔහු තෙවෙනි වතාවටත් සලාතය ඉටු කර පැමිණියේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ නැවතත් එසේ ම පැවසූහ. එවිට එම නබි හිතවතා "අල්ලාහ්ගේ දූතයාණෙනි, මම මීට වඩා හොඳ ආකාරයට සලාතය ඉටු කරන්නට නොදනිමි; සලාතය ඉටු කරන ආකාරය මට උගන්වන්න" යනුවෙන් ඉල්ලා සිටියේ ය. එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එම නබි හිතවතාට සලාතය ඉටු කරන ආකාරය ඉගැන්වූහ.

ඒ නිසා අප අපගේ සලාතයේ තත්ත්වය කුමක් ද? අපගේ සලාතය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ සලාතයට අනුව ම තිබේ ද? නැත් ද? යන්න දෛනිකව ම විමසා බලා නිවැරදිව සලාතය ඉටු කිරීමට පුරුදු විය යුතු ය.

## සලාතය අත් හැරීම මහත් වරදකි

* "නියත වශයෙන් ම, මුස්ලිම්වරයෙකු සහ කාෆිර් අතර වෙනස සලාතය අත් හැරීමයි" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (මුස්ලිම්)

* "අප හා ඔවුන් (මුස්ලිම් නොවන කාෆිර්වරුන්) අතර පවතින ගිවිසුම සලාතයයි. එය (සලාතය) අත් හරින්නා නියත වශයෙන් ම කාෆිර් බවට පත්වේ" යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (තිර්මිදී)

" فِيْ جَنّٰتٍ يَّتَسَآءَلُوْنَ عَنِ الْمُجْرِمِيْنَ مَاسَلَكَكُمْ فِيْ سَقَرَ قَالُوْا لَمْ نَكُ مِنَ الْمُصَلِّيْنَ "

"ස්වර්ගයේ වැසියෝ වරදකරුවන්ගෙන් අසති. සකර් නම් නිරයෙහි ඔබ ව අතුළත් කළේ කුමක් ද?, (යනුවෙන්) එවිට ඔවුහු සලාතය ඉටු කරන්නන් අතර අපි නොසිටියෙමු, යැයි පවසති"

(74:4043)

" فَخَلَفَ مِنْ بَعْدِهِمْ خَلْفٌ أَضَاعُوا الصَّلَاةَ وَاتَّبَعُوا الشَّهَوَاتِ فَسَوْفَ يَلْقَوْنَ غَيًّا

"මොවුන්ගෙන් පසුව (නොමග ගිය) දුශ්චරිතයෙන් පැවත එන්නෝ මොවුන්ගේ ස්ථානයට පත් වූහ. සලාතය (ඉටු නොකර) අපතේ යැවූහ. ඉච්ඡාවන් අනුගමනය කළහ. එබැවින් ඔවුහු (පරලොවේ දී) මහත් විනාශයකට (නිරය) මුහුණ පාති" (19:59)

"සලාතය සුරකින්නාට (ඉටු කරන්නා) එය පරලොවේ දී ආලෝකයක් වශයෙන් ද සාක්ෂියක් වශයෙන් ද නරකාදියෙන් ආරක්ෂාකරන්නක් වශයෙන් ද තිබේ. එය සුරක සලාතය ඉටු නොකරන්නාට එය ආලෝකයක් වශයෙන් හෝ සාක්ෂියක් වශයෙන්

හෝ නිරයෙන් ආරක්ෂා කරන්නක් වශයෙන් නොපවතී. තවද ඔහු පරලොවේ දී කාරූන්, ෆිර්අව්න්, හාමාන්, උබෛ ඉබ්නු කලෆ් වැන්නන් සමග නැගිටවනු ලබයි" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (අහ්මද්, තබරානී)

## අනිවාර්ය වන සලාත් නියමිත වේලාවන්හි ඉටු කිරීම.

" إِنَّ الصَّلَاةَ كَانَتْ عَلَى الْمُؤْمِنِينَ كِتَابًا مَّوْقُوتًا "

"නියත වශයෙන් ම, සලාතය මුඃමින්වරුන් හට කාලය නියම කරන ලද වගකීමකි" (4:103)

* "අල්ලාහ් වෙත ඉතා ප්‍රියතම අමල් කුමක්දැයි ; මම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගෙන් විමසුවෙමි. සලාතය එහි ආරම්භක වේලාවේ දී ම ඉටු කිරීම යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ." යනුවෙන් අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රලියල්ලාහු අන්හු තුමා ප්‍රකාශ කරයි. (සහීහුල් බුහාරී)

## ජමාඅත් වශයෙන් සලාතය ඉටු කිරීම ඉතා වැදගත් සුන්නතයකි.

නබිසල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත අන්ධ මිනිසෙක් පැමිණ, "අල්ලාහ්ගේ දූතයාණෙනි, මා මස්ජිදයට කැටුව යාමට කිසිවෙකු නැතැ" (යි පවසා) නිවසේ දී (තනියම) සලාතය ඉටු කිරීමට අවසර පැතුවේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඔහුට නිවසේ දී සලාතය ඉටු කිරීමට අවසර දුන්හ. එම මිනිසා ආපසු හැරුණු විට ඔහු කැඳවා "අදාන් හඬ" ඔබට ඇසෙන්නේදැයි විමසූහ. එයට හෙතෙම "ඔව්" යැයි කීය. එසේ නම් සලාතයට (මස්ජිදයට) පැමිණිය යුතුයැයි පැවසූහ. (සහීහ් මුස්ලිම්)

"ජමාඅත් වශයෙන් ඉටු කරනු ලබන සලාතය තනියම ඉටු කරනු ලබන සලාතයට වඩා විසි හත් ගුණයක් (ආනිසංසවලින්) උතුම්" බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (සහීහුල් බුහාරී, සහීහ් මුස්ලිම්)

අදාන් කියා සලාතයට කැඳවා සලාතය ඉටු කරවීමට කෙනෙකු පත්කර සලාතයට නොපැමිණෙන්නන්ගේ නිවෙස් වලට ගොස් ඔවුන්ගේ නිවෙස් ගිණිබත් කිරීමට තමන්ට සිතෙන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (අහ්මද්)

කෙනෙකු මුස්ලිම්වරයෙක් ද? නැත් ද? යන්න බෙද වෙන්කර පෙන්වන එක ම පිළිවෙත සලාතය වේ. වැඩිවියට පත්, හොඳ සිහියෙන් යුත් සෑම මුස්ලිම්වරයෙකුට ම දිනපතා පස් වතාවක් සලාතය ඉටු කිරීම අනිවාර්ය වගකීමකි. සව්ම්, Zසකාත්, හජ්

වැනි වත්පිළිවෙත් ඉස්ලාම්හි මූලික වගකීම් වුව ද ඒවා පිළිබඳව සමහර සහන හා විකල්ප ද ඇත. පහසුකම් නොලද අයට zසකාත්, හජ් යනාදිය අනිවාර්ය නොවේ. ශරීර ශක්තිය නොමැත්තන්, මගීන්, කිරිදෙන මව්වරුන්, ගැබිණි මව්වරුන්, රෝගීන් වැන්නන්ට සව්ම් සමාදන් නොවී වෙනත් දිනයක සව්ම් සමාදන් වීමට සහනයක් ඇත. එහෙත් සලාතය අත් හැරීමට හොඳ සිහියෙන් පසුවන, වැඩි වියට පත් කිසිම මුස්ලිම්වරයෙකුට කිසිම වේලාවක අනුමැතියක් නොමැත.

කෙනෙකුට සිට ගෙන සලාත් ඉටු කළ නොහැකි නම් හිඳගෙන ද, හිඳගෙන ඉටුකළ නොහැකි නම් හාන්සිවෙමින් ද ජලය නැතිවිටක හෝ ජලය ඇති විටක එමගින් වුළූඃ කළ නොහැකි විටක තයම්මුම් කිරීමෙන් ද සලාතය ඉටුකළ යුතු ය. ඉස්ලාමය ආරක්ෂා කර ගැනීම සඳහා සතුරන් සමඟ සටන් වදින අවස්ථාවේ ද සලාතය අත් හැරීමට අවසර නොමැත.

යමෙක් ඕනෑකමින් ම සලාතය අත්හරින්නේ නම් ඔහු ඉස්ලාමයෙන් ඉවත් වී යයි. පරලොවේ දී නිරයට යෑමට ප්‍රථම හේතුව වන්නේ ද සලාතය අත් හැරීමයි. "අල්ලාහ් අප සියළු දෙනාම නිරයේ වේදනාවලින් ආරක්ෂා කරත්වා! සලාතය කෙතරම් වැදගත් වත් පිළිවෙතක් ද යන්න දැන ගතිමු ; මින් ඉදිරියට අප ජීවිතයේ මරණය දක්වා පංචකාල සලාත් මනාව, ක්‍රමවත්ව බිය හා භක්තියෙන් ඉටුකර, ප්‍රයෝජනය අත්කර ගනිමු."

## අභ්‍යාස

1. මස්ජිද්වල ජමාඅත් වශයෙන් සලාතය ඉටු කිරීමෙන් අත්වන ඵල කවරේ දැ යි සාකච්ඡා කරන්න.
2. සලාතය ඉටු නොකරන්නන් සලාතය ඉටු කිරීමට පොළඹවන්නේ කෙසේ ද?
3. සලාතය මෙහෙයවන ක්‍රම පිළිබඳ ව පහදන්න.

## 2.2 zසකාත් ප්‍රදනය කරමු

* zසකාත් ඉස්ලාම් හි පංච මහා වගකීම් වලින් එකකි.
* සලාතය ගැන පවසන අල්කුර්ආන් වැකිවල zසකාත් ගැන ද සඳහන් වේ.
* zසකාත් ප්‍රදනය කරන කෙනෙක් තමා හා තමන් සතු ද්‍රව්‍ය ද පවිත්‍ර කර ගනියි.
* zසකාත් අනිවාර්ය වන ද්‍රව්‍ය, ප්‍රමාණය හා ලැබීමට සුදුස්සන් ගැන ද ඉස්ලාම් විග්‍රහ කරයි.
* zසකාත් හි පරමාර්ථය ඉටුවන්නේ එය නියමිත ආකාරයට අය කරනු ලැබ බෙද හැරීමෙනි.

.

### zසකාත් හි වැදගත්කම

zසකාත් ඉස්ලාම්හි පංච මහා වගකීම් අතරින් එකකි. නිශ්චිත පිරිසකට නියමිත කාලයේ දී තෝරාගත් ද්‍රව්‍ය වලින් විවිධ කොන්දේසි යටතේ ඉටු කළ යුතු ධනය මත අනිවාර්ය වූ වගකීමකි.

අල්ලාහ්, අල්කුර්ආනයේ බොහෝ තැන්වල සලාතය සමග එකතු කර මේ පිළිබඳව පවසා ඇත. මෙයින් මෙහි වැදගත්කම මනාව වැටහේ. කිසිම මුස්ලිම්වරයෙකු සලාතයේ වැදගත්කම ප්‍රතික්ෂේප නොකරයි. එසේ ම මෙහි වැදගත්කම සලාතය සමග සම්බන්ධ කර පවසා තිබීමෙන් වටහා ගත හැකි ය.

zසකාත් අනිවාර්ය වන වගකීමක් බව මුස්ලිම් විද්වතුන්ගේ ඒකමතික මතයයි. ඒ නිසා මෙය (ෆර්ල් බව) දැන සිටිය යුතු අතර යමෙක් මෙය ප්‍රතික්ෂේප කළේ නම් ඔහු ඉස්ලාම් දහම හැර ගියෙකු වශයෙන් සැලකේ.

"යමෙක් ඒ ගැන (එය ඉටු කිරීමේ දී) ලෝබකම දක්වන්නේ ද හෝ එයින් යමක් අඩු කළේ ද හෙතෙම දඬුවමට පාත්‍ර වූවෙකි."

අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි.

" وَأَقِيمُوا الصَّلَاةَ وَآتُوا الزَّكَاةَ "

"සලාතය ඉටු කරන්න zසකාතය ද ගෙවන්න"

(2 : 110)

"අල්ලාහ් වෙනුවෙන් වත්පිළිවෙත්; පවිත්‍ර වන්තයින් වශයෙන් ද (වැරදි මාර්ගයෙන් ඉවත් වී නිවැරදි මාර්ගයෙන්) ඇල්මක් ඇති ව ඔවුන් අල්ලාහ් ව නැමදිය යුතු ය. තව ද සලාතය ඔවුහු තහවුරු කළ යුතු ය. තවද zසකාතය ඔවුහු ගෙවිය යුතුය; යන්න හැර (වෙනින් දෙයක්) ඔවුන්ට අණ නොකළේය. මෙයයි ඍජු මාර්ගය වනුයේ (98:5)

(මූලික වන) පහක් මත ඉස්ලාම් පිහිටා ඇති බව අල්ලාහ් ගේ දූතයා සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසූ විට සකාත් ගෙවීම ද ඒකාබද්ධ කොට ඇත.

යෙමන් දේශයට සංදේශයක් යැවූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "ඒකත්වය, සලාතය ආදී පෙර සඳහන් ඒවාට ඔවුන් කීකරු වී අවනත වෙතොත් නියත වශයෙන් ම අල්ලාහ් ඔවුන්හට zසකාතය අනිවාර්ය වගකීමක් කර ඇති බව පවසයි. ඔවුන් අතරින් පහසුකම් ඇති අයගෙන් ලබාගෙන දිළින්දන්හට බෙදා දිය යුතු බව ඔවුන්ට දැනුම් දෙන්නැයි" පවසා ඇත.

තවද zසකාත් ඉටු කිරීම අත්හරින්නා, එය ප්‍රතික්ෂේප කරන්නා (කුෆ්ර්හි) පිටු දැකීමෙහි සිටින බව අල්ලාහ් පවසයි.

"එබැවින් ඔවුන් (තම පව් වලින් බැහැර වී) පශ්චාත්තාප වී, සලාතය ද ඉටුකර, zසකාතය ද ගෙවමින් සිටින්නේ නම් (ඔවුන්) ඔබලාට ආගමික සහෝදරවරු වෙති"

(9:11)

සලාතය ඉටුනොකර zසකාතය ද නොගෙවන්නා ඉස්ලාමික සහෝදරවරු යන නෑකමක් නොලබයි. ඒ නිසාම අබූබක්ර් සිද්දීක් රළියල්ලාහු අන්හු තුමා සලාතය හා zසකාත් අතර වෙනස්කම් පෙන්වා දී එය (zසකාත්) දීම ප්‍රතික්ෂේප කළ අය සමග සටන් කෙළේ ය. එයට (ඔවුන් සමග සටන් කිරීමට අබූබක්ර් රළියල්ලාහු අන්හු ගත් තීරණයට) නබි හිතවත්තු එකඟ වූහ. එමනිසා එය නබි හිතවතුන්ගේ ඒකමතික මතය වූ ඉජ්මාඃ හි තත්ත්වය ගත්තේ ය.

## zසකාත් හි ප්‍රයෝජන :

* zසකාත් ගෙවීමේ පුරුද්ද ඇත්තන් ලෝබකමින් ඈත් වන අතර ඔවුන්ගේ දේපළ ද පවිත්‍ර වේ.
* මුස්ලිම්වරුන් අතර දන් දීමේ සිතුවිල්ල ඇති කරයි.
* දුප්පතා සහ ධනවතා අතර ඇල්මක් හා අනුකම්පාවක් ඇති කරයි. තමන්ට උපකාර කරන්නන් කෙරෙහි ඇල්මක් දැක්වීම මිනිස් සිත් වල ස්වාභාවයයි.
* දුප්පතාගේ වුවමනාවන් ඉටුකරනු ලබන අතර; සොරකම, සිඟමන යනා දී පහත් ක්‍රියාකාරකම් අඩුවෙයි.
* අල්ලාහ් විසින් මිනිසාට ලබා දී ඇති නිඃමත් බෙදා දෙනු ලබයි.

මෙසේ අල්ලාහ් ධනවතුන්ගේ ධනයෙන් කොටසක් දුප්පතුන්ට අයිති බව තීරණය කර ඇත. මීට වඩා වැඩියෙන් යමෙක් ප්‍රදානය කරන්නේ නම් එය ප්‍රශංසනීය කරුණකි.

## zසකාත් අනිවාර්ය වන ද්‍රව්‍යඃ

* රන්, රිදී හා මුදල්
* වෙළෙඳ භාණ්ඩ
* පශු සම්පත් (එළුවන්, ගවයන් හා ඔටුවන්)
* ධාන්‍ය (වී, තිරිඟු වැනි)
* පලතුරු (මිදි, රට ඉඳි)

### රත්තරන් හා රිදීඃ

කුමන වර්ගයට අයත් රත්‍රන් හා රිදී වුව ද ඒවාට සකාත් දීම අනිවාර්ය වේ. නිසාබ් නම් අවම ප්‍රමාණයේ රත්‍රන්, රිදී, කෙනෙකු සතුව තිබේ නම් ඔහුට zසකාත් අනිවාර්ය වේ. රත්‍රන් හි නිසාබ් ප්‍රමාණය වනුයේ මිස්කාල් 20 ක් හෙවත් ග්‍රෑම් 85 කි. රිදී හි නිසාබ් දිර්හම් 200 ක් හෙවත් ග්‍රෑම් 295 කි.

### වෙළෙඳ භාණ්ඩඃ

වෙළෙඳාමෙහි නියැලී සිටින මුස්ලිම් වෙළෙඳුන් වාර්ෂිකව zසකාත් ගෙවීම ඉස්ලාම් විසින් අනිවාර්ය කර ඇත. ලාභය අරමුණු කොට ගෙන ගනුදෙනු කරනු ලබන සෑම භාණ්ඩයක ම zසකාත් අනිවාර්ය වේ. මේවායෙහි zසකාත් මුදල නිසාබ් නම් අවම ප්‍රමාණය සම්පූර්ණ වී තිබිය යුතු ය. ඒවා අතරින් රිදී වල අගයට අනුව ගෙවීම උතුම් බව බොහෝ ආලිම්වරු පවසා සිටිති. වෙළඳුන් සෑම වර්ෂයේ ම තමන්ගේ වෙළෙඳ භාණ්ඩවල මිල තක්සේරු කිරීම අනිවාර්ය වේ. රත්තරන්, රිදි මුදල් වෙළෙඳ භාණ්ඩවල අවම ප්‍රමාණය තිබුණත් 2½ % zසකාත් ප්‍රදනය කළ හැකිය.

### කෘෂි ද්‍රව්‍ය ඃ

* රට ඉඳි හා මිදි
* තිරිඟු සහ සහල් ආදිය

අස්වනු , නිසාබ් නම් අවම ප්‍රමාණයට පත් වේනම් zසකාත් අනිවාර්ය වේ. ධාන්‍යවල ආරම්භක නිසාබයේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 698.5 කට සමානය. වසර සම්පූර්ණ වීම කොන්දේසියක් නොවේ. අස්වැන්න නෙළා ගත් විට මෙය අනිවාර්ය වේ.

මේවා වැසි ජලය, ගංගා ජලය, වැනි වාරි ක්‍රම මගින් ජලය සපයා වියදම් රහිතව වගා කරන ලද්දක් නම් 10%ක් zසකාත් අනිවාර්ය වේ. ජලය සැපයීම සඳහා වියදම් කර ඇත්නම් 5% ක් zසකාත් අනිවාර්ය වේ.

**පශු සම්පත් :**

* ඔටුවන්, ගවයින්, එළුවන්,

මොවුන් නිසාබ් තත්ත්වයට පත්විය යුතුයි. ඔටුවන් ගේ නිසාබ් 05 කි. එළුවන්, බැටළුවන් ගේ නිසාබ් 40 කි. ගවයින් ගේ නිසාබ් 30 කි. මීට වඩා අඩු ප්‍රමාණයට zසකාත් අනිවාර්ය නොවේ.

* මේවා අයිතිකරු සතුව අවුරුද්දක් සම්පූර්ණ ව තිබිය යුතුයි.

**ගවයින් ගේ zසකාත් පිළිබඳ වගුව**

| ප්‍රමාණය | Z සකාත් |
|---|---|
| 30 සිට 39 දක්වා | අවුරුද්දක් සම්පූර්ණ වූ එළදෙනෙක් |
| 40 සිට 59 දක්වා | අවුරුදු දෙකක් සම්පූර්ණ වූ එළදෙනෙක් |
| 60 සිට 69 දක්වා | අවුරුද්දක් සම්පූර්ණ වූ වස්සන් දෙදෙනෙක් |
| 70 සිට 79 දක්වා | අවුරුදු දෙකක් සම්පූර්ණ එළදෙනෙක් සහ අවුරුද්දක් සම්පූර්ණ වූ වස්සෙක් |

**එළුවන් ගේ zසකාත් පිළිබඳ වගුව**

| ප්‍රමාණය | Z සකාත් |
|---|---|
| 40 සිට 120 දක්වා | එළුවෙක් |
| 121 සිට 200 දක්වා | එළුවන් දෙදෙනෙක් |
| 201 සිට 300 දක්වා | එළුවන් තිදෙනෙක් |
| 301 සිට 400 දක්වා | එළුවන් හතර දෙනෙක් |
| 401 සිට 500 දක්වා | එළුවන් පස් දෙනෙක් |
| මීට වඩා වැඩි වන සෑම සියයකට ම එළුවෙක් දිය යුතු ය. | |

## zසකාත් ලැබීමට සුදුස්සෝ

අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි.

" (zසකාත් නම්) දන දුප්පතුන් ට ද අඩු ආදායම් ලාභීන්ට ද  මේවා (දන) අය කරන සේවකයින්ට ද, (ඉස්ලාම් කෙරෙහි) තම සිත බැඳුන උදවියට ද වහලුන් නිදහස් කිරීමට ද ණයවී සිටින්නන්ට ද අල්ලාහ් ගේ මාර්ගයෙහි (සටන් වැද සිටින) නියැළී සිටින්නන්ට ද මගීන්ට ද හිමි වේ. (මෙය) අල්ලාහ් විසින් නියම කරන ලද වගකීමකි. අල්ලාහ් (සෑම දෙයක් ම) දැන සිටින්නා ද ඥානවන්තයා ද වේ" (9.60)

**1). ෆකීර් (අන්ත දුප්පතා)**

දෛනික ව තමාට අත්‍යවශ්‍ය වන දේවල් පවා ලබා ගැනීමේ දුෂ්කරතාවයට පත් වූ අය.

**2). මිස්කීන් (දුප්පතා)**

තම අවශ්‍යතා සම්පූරණ ලෙස ඉටුකරගත නොහැකි වන අන්දමේ සුළු ආදායමක් ලබන්නා.

**3). ආමිල් (සකාත් කාර්යයේ නියළෙන්නන්)**

zසකාත් කාර්යයේ නියැළි සිටින්නන් මින් අදහස් කෙරේ. සකාත් එක්රැස් කිරීම, ආරක්ෂා කිරීම, සටහන් තැබීම, බෙදාහැරීම යනා දී කාර්යන් හි මොහු නියැලේ

**4). මුඅල්ලෆතුල් කුලුබ් (සිත් බැඳුනු උදවිය)**

අලුතෙන් ඉස්ලාමය වැලඳගත් අයත් ඉස්ලාමය ගැන පැහැදී ඒ කෙරෙහි කුලුපග වී සිටින අයත් මින් අදහස් කෙරේ.

**5). අර්රිකාබ් (වහල් බවින් මුදවා ගැනීමට/ සිරෙන් නිදහස් කිරීමට)**

වහලුන් නිදහස් කර ගැනීමටත් සතුරන් විසින් අත් අඩංගුවට ගන්නා ලද අය නිදහස් කර ගැනීමටත් zසකාත් ප්‍රයෝජනයට ගත හැකි ය.

**6). ගාරිමුන් (ණය බරින් මිරිකුණු අය)**

මොවුන්ගේ ණය පියවා ගැනීමට zසකාත් මුදලින් ගෙවිය යුතු ය. එහෙත් මුස්ලිම්වරයෙකු වීමත් ණය පියවීමට පහසුකම් ඇති ධනවතෙකු නොවීමත් ඔවුන්ගේ ණය පාපතර කටයුතු සඳහා නොවීමත්  ණය වාරිකය පිරවීමේ කාලය එළඹ තිබීමත් අවශ්‍යය.

**7). ෆී සබිලිල්ලාහ් (අල්ලාහ්ගේ  මාර්ගයෙහි යෙදී සිටින්නන් )**

අල්ලාගේ තෘප්තිය පතා ඔහුගේ දහම ස්ථාපිත කිරීමෙහිලා අවශ්‍ය කටයුතුවල යෙදෙන්නන් මෙම පදයෙන් අදහස් කෙරේ.

8). ඉබුනුසබීල් (මගියා)

ගමට ආපසු යා නොහැකිව අතර මග නැවතී සිටින මගියෙක්, තමන් ගේ ගමේ ඔහු ධනවතෙකු වුව ද ඔහු ගමට ළඟා වන තුරු අවශ්‍ය පමණක් zසකාත් මුදලින් ලබා දිය යුතු ය.

***සටහන**

**සමුද්‍ර ද්‍රව්‍ය වලින් zසකාත්**

මුතු, පබළු, මත්ස්‍යයින් වැනි සමුද්‍රයෙන් ගනු ලබන ද්‍රව්‍ය වලින් වෙළෙඳාමට යැයි වෙන් කරන ලද ඒවා හැර අනෙකුත් ඒවාට zසකාත් අනිවාර්ය නොවේ.

**අභ්‍යාස**

1. zසකාතයේ වැදගත්කම පවසන්න.
2. zසකාත් හි ප්‍රයෝජන විමසන්න.
3. zසකාත් අනිවාර්යවන ද්‍රව්‍ය මොනවා ද?
4. zසකාත් ලැබීමට සුදුස්සෝ කවරහු ද?

## 2.3 හජ් ඉටු කරමු

ඉස්ලාම් ධර්මයේ පදනම වූ පංච මහා යුතුකම් අතරින් හජ් අවසාන යුතුකම වේ. හජ් යන අරාබි වචනය යම් කිසි ස්ථානයක් කරා යෑම යන භාෂාමය අරුත ගෙන දෙයි. ඉස්ලාමීය ෂරිආ නීතිය අනුව සුදුසුකම් සපුරා ඇති මුස්ලිම්වරුන් ස්වකීය ජීවිත කාලයේ එක් වතාවක් හෝ ශුද්ධ වූ මක්කා නගරයට ගොස් දුල්හජ් මාසයේ 8 වැනි ද සිට 13 වැනි ද දක්වා වූ කාල සීමාව තුළ ඉටුකරන්නා වූ යම් වත් පිළිවෙත් හජ් යැයි හඳුන්වනු ලැබේ. හජ් ක්‍රියාවේ විශේෂත්වය වන්නේ එය ඉටුකරන්නා තමගේ ධනයෙන්, ශක්තියෙන් හා ශාරීරික වශයෙන් එයට දයක වීම ය.

හජ් ක්‍රියාවේ සුවිශේෂත්වය ගැන අල් කුර්ආනය ද නොයෙකුත් තැන්වල සඳහන් කරයි. සුරා ආල ඉම්රාන් හි අල්ලාහ් පහත සඳහන් පරිදි දේශනා කරයි.

"මිහිපිට (දෙවියන් වැඳුම් පිදුම් කිරීමට) මිනිසුන් උදෙසා ගොඩ නැගූ දේවස්ථාන අතරින් ප්‍රමුඛතම ස්ථානය හිමිවන්නේ බක්කාවෙහි පිහිටා තිබෙන්නා වූ ශුද්ධවූ දේවස්ථානයයි. එය (ආශිර්වාද කරන ලැබුවා වූ ද) මහා භාග්‍ය සම්පන්න වූවක් ද වන අතර මිනිසාට ඍජු මාර්ගය පෙන්වන්නක් ද වෙයි. එහි පැහැදිලි සාධකයක් ඇත. ඉබ්‍රාහිම් (අලෛ) සලාතය සඳහා සිටගත් ස්ථානය ද ඇත. කවරෙකු එහි ඇතුළු වන්නෝ ද ඔහු (ආරක්ෂාව ලැබූ) භීතියෙන් තොර වූ අයෙක් වන්නේ ය. (එම නිසා) කවරෙකු හෝ එය වන්දනා මාන කිරීමට ශක්තිය ලබා ඇත්තේ නම් එකී ස්ථානයට ගොස් හජ් ඉටුකිරීම ඔවුන්ගේ වගකීමකි. තව ද යම් කෙනෙකු මෙය පිළිනොගත්තේ ද එමගින් අල්ලාහ්ට කිසි ම අඩුවක් නොවන්නේ ය. සත්‍ය වශයෙන් ම අල්ලාහ් මැවීම් මත යැපෙන්නෙකු නොවන්නේ ය. (3: 9697)

ඉහත සඳහන් කුර්ආන් වැකියේ බක්කා යනුවෙන් සඳහන් වන්නේ මක්කා නගරයයි. එම සුරාවේ අවසාන භාගයේ හජ් හි වැදගත්කම පෙන්වා දෙයි. පහත සඳහන් හදීස් මගින් එය තව දුරටත් සනාථ වන්නේ ය.

- ✸ අල්ලාහ්ගේ ශුද්ධ වූ වාසස්ථානය වෙත යෑමට අවශ්‍ය වියහියදම්, යානවාහන යම් කෙනෙකු සතුව තිබිය දී හේ හජ් ඉටු නොකර මිය යන්නේ නම් එකී මිනිසා යහුදි කෙනෙකු හෝ නසරානියකු ලෙස මිය යද්දෙන්. එබැවින් එහි ගොස් වැඳුම් පිදුම් කිරීමට ශක්තිය ලැබ ඇති තැනැත්තා හජ් සඳහා ගොස් එහි වත් පිළිවෙත් ඉටු කිරීම යුතුකමකි. (තිර්මිදි)

- ✸ නබි තුමන්ගෙන් " යහ ක්‍රියාවන්ගෙන් උසස් ම යහ ක්‍රියාව කුමක් ද යි" විමසූ කල්හි 'අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා විශ්වාස කිරීම' යැයි එතුමාණෝ පැවසූහ. "මීළඟට කුමක් ද" යි අසා සිටි විට 'අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම' යැයි කියා සිටියහ. "මීළඟට කුමක්ද" යි විමසූ විට "අල්ලාහ් පිළිගත් හජ්" යැයි පැවසූහ. (බුහාරී)

- ✸ වයෝවෘද්ධයන්, දුබලයන් හා කාන්තාවන් යනාදීන්ගේ ජිහාදය හජ් වේ. (නසාඊ)

- හජ් ඉටුකිරීමට අදිටන් කරගත්තවුන් ඉක්මනින් එය ඉටුකරත්වා! මන්ද යත් ඔහු හජ් ඉටුකිරීමට නොහැකි ව රෝගාතුර විය හැකියි. ඔහුගේ වාහනය අතුරුදහන් විය හැකියි. නැතිනම් ඔහුට වෙනයම් කටයුත්තක අවශ්‍යතාවක් මතු විය හැකි ය. (අහමද්)

- හජ් උම්රා ඉටුකරන්නන් අල්ලාහ්ගේ අමුත්තන් ය. ඔවුන්ගේ ප්‍රාර්ථනාවන් ඔහු ඉටු කරයි. යමක් ඉල්ලා සිටිය ද අල්ලාහ් එය ලබා දෙයි. (බස්සාර්)

- හජ් ඉටු කිරීමට දරන වියදම අල්ලාගේ මාර්ගයේ 700 ගුණයක් වියදම් කිරීම හා සමාන වේ. (අහමද්)

- හාජි කෙනෙකු තම ඥාතීන් 400 දෙනෙකු වෙනුවෙන් පරමාන්ත දිනයේ දී සාක්ෂි දරයි. (බස්සාර්)

- ඔබ හජ්, උම්රා යුතුකම ඉටු කරන්න. කම්හලේ තාප උදුනෙන් යකඩ, රන් , රිදී සුපිරිසිදු වන්නා සේ හජ් උම්රා ඔබගේ පව් ඉවත් කරයි.

අල්ලාහ් පිළිගත් හජ් ක්‍රියාවට ස්වර්ගය හැර වෙන ආනිශංස නැත. (තිර්මීද්)

ඉහත සඳහන් හදීස් සියල්ල හජ් ක්‍රියාවේ වැදගත්කම හා ප්‍රයෝජන ගැන පහදා දෙයි.

තව ද හජ් ක්‍රියාව හා සම්බන්ධ නීති රීති ඉහළ පංතිවල දී ඉගෙන ගනිමු. මෙම මාතෘකාවට අදාළ තවත් තොරතුරු යථා කාලයේ දී අපි ඉගෙන ගනිමු.

**අභ්‍යාස**

මෑතක දී හජ් ඉටුකළ හාජි කෙනෙකු මුණ ගැසී ඔහු කිනම් ආකාරයකට හජ් ඉටු කළේ ද? යන්න විමසා දැනගන්න. ඔහුගේ විශේෂ අත්දැකීම් අසා ගොනු කර ලියන්න.